**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 08 දින සභාපතිවරයා වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.1,080,000 ක් වූ හිඟහිටි එක්වන් මුදල් ලැබීම් ප්‍රාග්ධන ආධාර ලැබීම් ගිණුමට බැර කර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබිය දී වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවට මුද්දර ගාස්තු ලෙස රු.265,408 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට රු.35,520 ක් වූ වෙළඳ බදු හිඟය ගිණුම්වල දක්වා නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

**---------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.17,523,034 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් දක්නට ලැබුණු අතර, නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.272,697 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

(i) සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ එකතුව රු.42,200,919 ක් වූ 2001 වර්ෂයේ සිට ඉදිරියට එන ලැබිය යුතු ගිණුම් ශේෂ 08 ක වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වසර 03 කටත් අධික කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවැති රු.1,746,399 ක් වූ හිඟ එක්වන් මුදල් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, අවුරුදු 02 ත් අවුරුදු 05 ත් අතර කාලසීමාවට අදාළ රු.12,380,070 ක් වූ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.221,214,767 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම්** |
|---|---|---|
| | රු. | |
| (අ) **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | |
| 134(1) හා (2) වගන්ති | - | සභාව සතු දියුණු කළ ප්‍රදේශ වරිපනම් කළාප ලෙස ප්‍රකාශයට පත්කර, වරිපනම් බදු අයකර, සභා අරමුදල ශක්තිමත් කර ගතහැකි වුවත්, එවැනි සමීක්ෂණයක් පවත්වා නව වරිපනම් ඒකක හඳුනාගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| | මුදල් රෙගුලාසි 396(ඇ) | 319,691 | සභාවේ පොදු බැංකු ගිණුම හා කර්මාන්ත ගිණුමෙන් නිකුත් කළ, ගෙවීම සඳහා ඉදිරිපත් නොකල චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සභාව සතු කිසිම වාහනයක ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.20,201,662 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,252,258 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

සභාව සතු පොදු බැංකු ගිණුමේ සාමාන්‍ය මාසික ශේෂය රු.3,211,220 ක් වූ නමුත්, එම අතිරේක මුදල් ආයෝජනය කර, අතිරේක ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 720,000 | 776,553 | 592,363 | 3,286,121 | 2,528,041 | 782,026 | 234,756 | 3,079,874 |
| කුලී | 8,145,400 | 3,878,200 | 2,781,042 | 6,977,650 | 6,349,800 | 3,924,220 | 2,558,418 | 5,948,839 |
| බලපත්‍ර ගාස්තු | 300,000 | 235,986 | 235,986 | 123,350 | 300,000 | 338,080 | 338,080 | 123,350 |
| වෙනත් ආදායම් | 2,411,000 | 25,354,955 | 10,527,128 | 48,912,095 | 12,961,000 | 20,319,120 | 13,817,114 | 30,811,380 |
| | 11,576,400 | 30,245,694 | 14,136,519 | 59,299,216 | 22,138,841 | 25,363,446 | 16,948,368 | 39,963,443 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.11,576,400 ක් ද, බිල්කළ ආදායම රු.30,245,694 ද, වර්ෂය තුළ රැස් කළ ආදායම රු.14,136,519 ක් ද වූ අතර, හිඟ ආදායම රු.59,299,216 ක් විය.

### 2.3.3 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම හා වර්ෂය ආරම්භයේ හිඟ ශේෂය සමඟ රු.3,856,427 ක් රැස්කළ යුතු ආදායමින් වර්ෂය තුළ රැස්කළ ආදායම රු.592,363 ක් බැවින් වර්ෂය අවසානයට වූ හිඟ ශේෂය රු.3,286,121 ක් විය.

### 2.3.4 බදු කුලී

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගතයුතුව තිබූ රු.9,827,039 ක් වූ බදු කුලී මුදලින් වර්ෂය තුළ අයකර තිබුණේ රු.2,781,042 ක් හෙවත් සියයට 28 ක් පමණි. මේ හේතුව නිසා වර්ෂය අවසාන වනවිට හිඟ මුදල රු.6,977,650 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද, හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.3.5 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයට  බිල් කල ආදායම රු.235,986 ක් වූ අතර, එම මුදලම අය කරගෙන තිබුණු නමුත්, හිඟ ශේෂය වූ රු.123,350 න් කිසිදු මුදලක් අය කරගෙන නොතිබුණි.

### 2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.4,496,584 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.42,645,986 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කාර්යයසාධනය

---

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

---

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

#### (ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---

2015 අප්‍රේල් 15 න් පසුව මහජන විරෝධය හේතුවෙන් ඌරගස්මංහන්දියේ ක්‍රියාත්මක වූ කොම්පෝස්ට් ව්‍යාපෘතිය නතර කිරීමට සිදුවීම නිසා කොම්පෝස්ට් නිෂ්පාදනයට යොදා ගන්නා ලද යන්ත්‍ර සූත්‍ර නිෂ්ක්‍රීයව පැවැතුණි.

පෞද්ගලික සමාගමක් විසින් වසර 99 කට බදු ගෙන ඇති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමකට සභා බලප්‍රදේශයේ එකතු කරනු ලබන කසළ තාවකාලිකව බැහැර කරනු ලබමින් පැවැතුණු අතර, ඒ වෙනුවෙන් එම පෞද්ගලික සමාගමට මසකට රු.5,000 බැගින් ගෙවීම් කර තිබුණි.

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අංක PL/1/5/12 චක්‍රලේඛය ප්‍රකාර කසළ කළමනාකරණ යටතේ කසළ වර්ගීකරණය, කසළ අපහරණය, කසළ ප්‍රතිචක්‍රීකරණය පිළිබඳව මාර්ගෝපදේශ හා උපදෙස් අඛණ්ඩව ක්‍රියාත්මක කළයුතු වුවත්, ප්‍රාදේශීය සභාව තුළ එවැනි දීර්ඝකාලීන වැඩපිළිවෙලක් නොතිබුණි.

#### (ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

---

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බලප්‍රදේශයේ වීථි ආලෝකකරණය සම්බන්ධව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2010 අගෝස්තු 17 දිනැති අංක PE/01/01 චක්‍රලේඛය ප්‍රකාරව විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතව නොතිබීම හා විදුලි කණු අංක කර ලේඛනයක් පවත්වාගෙන නොයෑම නිසා සභාවට ලැබිය යුතු මුදල් ප්‍රතිපූර්ණය වී නොතිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලය හා උප කාර්යාලය සතු කඩ කාමර 11 ක් සම්බන්ධව 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/02 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව නව බදු ගිවිසුම් වලට එළඹ නොතිබුණු අතර, කඩ කාමර 36 ක් සම්බන්ධ ගිවිසුම් කල් ඉකුත් වී තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ කඩ කාමර 204 කින් රු.6,047,740 ක හිඟ ශේෂය හා දඩ මුදලක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

ප්‍රාථමික කාණ්ඩයේ තනතුරු 05 ක් අතිරික්තව පැවති අතර, මෙම තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

---------------------------

**3.4.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) කරන්දෙණිය ප්‍රාදේශීය සභාව සතු ට්‍රැක්ටර් 02 ක්, වයිබ්‍රේටින් රෝලක් හා ට්‍රැක්ටර් ට්‍රේලරයක් වසරකට අධික කාලයක් සිට නිෂ්කාර්යයව පැවැතුණි.

(ආ) ට්‍රැක්ටර් ට්‍රේලරයක් හා අංක රහිත ජල බවුසරයක් අපහරණය කිරීමට යෝජනා වී ඇතත්, වසර ගණනාවක් තිස්සේ අපහරණය කිරීමෙන් තොරව සභාවට අයත් භූමියක ගාල්කර තිබුණි.

**3.5 ආර්ථික නොවූ ගනුදෙනු**

-------------------------

කරන්දෙණිය ප්‍රාදේශීය සභාව විසින් කුසල්කන්ද ප්‍රජා ශාලාව ඉදිකිරීම වෙනුවෙන් 1999 දෙසැම්බර් මස 17 දින ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් රු.1,000,000 ක ණය මුදලක් ගැනීම සඳහා ගිවිසුම්ගතවී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව අදාළ ඉදිකිරීම නොකිරීම නිසා ණය මුදල රු.570,000 ක් දක්වා අඩුකිරීමෙන් 12% පොලිය සමඟ විගණිත දිනය වූ 2018 මැයි 14 දිනට ගෙවිය යුතු මුදල

රු.697,224 ක් විය. මෙම මුදලින් ඉටුකළ කාර්යයන් කිසිවක් විගණනයට ඉදිරිපත් නොකළ අතර, 2010 වසරේ ගංවතුර හේතුවෙන් පොත්පත් විනාශ වී තිබුණි.

### 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 කොන්ත්‍රාත් පාලනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කි.මී.1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ අඟනකැටිය හරස් පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ එක් වැඩ විෂයයක් වන අනුමත පස් යොදා රෝල භාවිතා කර, මාර්ගයේ සණ මීටර් 930 ක් සකස් කිරීමට රු.665,339 ක් වැයකර තිබූ අතර, ව්‍යාපෘතිය අවසන් කර, මාස 06 ක් ඉක්මවීමට පෙර යොදා ඇති පස් සේදී යාමෙන් මාර්ගයේ පෘෂ්ඨය මත කාණු සෑදී තිබුණි.

(ආ) පළාත් පාලන මාර්ග ව්‍යාපෘතිය යටතේ උපමානපාදක ප්‍රදාන මඟින් අඟනකැටිය හරස් පාර II සංවර්ධනය කිරීම සඳහා රු.499,276 ක මුදලක් ගෙවා තිබූ අතර, මාස 06 ක් ඉක්මවීමට පෙර මීටර් 20 ක දුරක මාර්ගය ගිලා බැස පෙරසැරි ගල් විනාශ වී තිබුණි.

(ඇ) පළාත් පාලන මාර්ග ව්‍යාපෘතිය යටතේ උපමානපාදක ප්‍රදාන මඟින් ඇස්කින්වත්ත පාසල් කන්ද පාර පෙරසැරි ගල් අල්ලා සංවර්ධනය කිරීම සඳහා රු.449,531 ක මුදලක් ගෙවා තිබූ අතර, මාර්ගය මධ්‍යයේ මීටර් 10 ක පමණ ගිලාබැස පෙරසැරි ගල් බුරුල් වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 02 ක අනුමත සීමාව ඉක්මවා වියදම් දරා තිබුණු අතර, එම සීමා ඉක්මවීම සියයට 17 ක් සහ සියයට 108 ක් විය.

(ආ) වියදම් විෂයයන් 05 ක ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම සියයට 22 සිට සියයට 61 දක්වා අතර පරාසයක පැවැතුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

-----------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කලමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය හා ලේඛන පැවැත්වීම | (i) | අවශ්‍ය ගැලපීම් කර, ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශන සහ ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර වෙනස්කම් පැවැතුණි. |
| | | (iii) | සභාව විසින් සමහර ලේඛන පවත්වා නොතිබුණි. |
| (ආ) | ස්ථාවර වත්කම් | (i) | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | පරිගණක සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | වාහන පාලනය | (i) | විධිමත් පරිදි වාහන ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| | | (ii) | ඇතැම් වාහන කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර, ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | (ii) | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි. |
| | | (iii) | වර්ෂ 05 කට වරක් තක්සේරු සිදුකර වරිපනම් ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | මානව සම්පත් කළමනාකරණය | | අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | අයවැය පාලනය | (i) | වියදම් විෂයයන් 02 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි. |
| | | (ii) | ආදායම් හා වියදම් පිළිබඳව පසු විපරම් කර, අයවැය සංශෝධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. |